# මල්වතු ඔය ආශ්‍රිත සිදු වූ ආර්ථික පසුබිම පිළිබඳ විමර්ශනයක්

එල්.ඒ.ඩී.පී.එම්. ලියනාරච්චි[1], එච්.එම්.එස්. සෙව්වන්දි[2]

කොළොම්හොය හෙවත් කදම්භ නදිය ලෙස ව්‍යවහාර වන මල්වතු ඔය අතීතයේ මෙන්ම වර්තමානයේදී ද, මානුෂීය, සමාජීය හා ආර්ථික වශයෙන් වැදගත් වූ නදියකි. මෙහි ඉහළ කොටස මල්වතු ඔය ලෙස සැලකෙන අතර පහළ කොටස "අරුවි ආරු" ලෙස හැඳින්වේ. රිටිගල ජල පෝෂක ප්‍රදේශයේ ආරම්භ වන කි.මී. 167 ක් මෙන්ම වර්ග කි. මී. 3286 ක ජලපෝෂක ප්‍රදේශයක් ආවරණය කරයි. අනුරාධපුර නගරය ආශ්‍රිත මල්වතු ඔයේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව අනුරාධපුර මුල් ඓතිහාසික යුගයේ ආරම්භයේ සිට ධාතුසේන රජු සමය දක්වා සංසන්දනාත්මක විමර්ශනයක් කිරීම අරමුණ වේ. ක්‍රමවේදය ලෙස ද්විතියික දත්ත භාවිතයට ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ ඉන්දීය ජනාවාසකරණයෙහි මුල් පියවර මෙම ගංගාව ආශ්‍රිතව සිදු විය. අනුරාධ නම් ඇමතියා අනුරාධ ග්‍රාමය හෙවත් වර්තමාන අනුරාධපුර නගරය මල්වතු ඔය ආශ්‍රිතව පිහිටුවා ගනු ලැබුවේ ද මල්වතු ඔයෙහි ආර්ථික වටිනාකම ලබාගැනීමේ අරමුණින් යුතුවය. එහිදී මේ වන විටත් මාතොට වරාය සක්‍රීය වෙළඳ වරායක් ලෙස බිහිව තිබුණි. මාතොට වරාය වෙත ලැබෙන භාණ්ඩ මල්වතු ඔය ජල මාර්ගය ඔස්සේ අනුරාධපුර නගරයට ගෙන ඒමේ වාසිය ලබාගැනීමේ අරමුණිනි. මල්වතු ඔය ආශ්‍රිතව තිබූ කර්මාන්ත හා වෙළඳාම පිළිබඳ අවධානය යොමු කිරීමේදී කුඹල් කර්මාන්තය, කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය පැවති බවට සාහිත්‍ය ලේඛන මගින් හෙළිදරව් කරගෙන ඇත. එහිදී ප්‍රධාන ආර්ථික කර්මාන්තය ලෙස කෘෂිකර්මාන්තය පැවති අතර ඒ සඳහා ජලය ලබාගැනීම මල්වතු ඔය ආශ්‍රයෙන් සිදු විය.මල්වතු ඔයේ ජලයෙන් නාච්චාදුව වැව නිර්මාණය කිරීම හා මල්වතු ඔයෙන් අමුණක් බැඳ හාල්පානු ඇල නිර්මාණයකර එහි ජලය හරස් කිරීමෙන් සකස් කරන ලද අමුණ මගින් මල්වතු ඔයේ ජලය අනුරාධපුර නගරය පුරා බෙදා හරින ලදී. තව ද මල්වතු ඔය ආශ්‍රිතව වෙළඳාම දියුණුව පැවති බවට සාක්ෂි පවතී. වෙරළබඩ වරායන් මගින් භාණ්ඩ ලබාගෙන ඒවා රට අභ්‍යන්තරයට රැගෙන ඒමට මල්වතු ඔය ප්‍රවාහන මාධ්‍යයක් ලෙස යොදා ගෙන ඇත.ජේතවනාරාම කැණීමෙහි දී හමු වූ පබළු, වීදුරු හා පුරාණ කාසි මගින් ගම්‍ය වන්නේ අනුරාධපුර නගරයේ මල්වතු ඔය ආශ්‍රිත ප්‍රදේශය වෙළඳ නගරයක්ව පැවති බවයි. මෙම වෙළඳ නගරය වෙත බඩු භාණ්ඩ රටෙහි සෑම තැනකම සිට ගෙන එන ලද්දේ මල්වතු ඔය ජල මාර්ගය ආශ්‍රිතවය. එසේම මල්වතු ඔය අශෝකාරමයට නුදුරින් පිහිටා ඇති පුරාණ පාලම මගින් ගම්‍ය වනුයේ මාතොට වරාය සමග සම්බන්ධ වූ මල්වතු ඔය හරහා රැගෙන ආ භාණ්ඩ අනිකුත් ප්‍රදේශ දක්වා රැගෙන ගිය පුරාණ මාර්ග පද්ධතියයි. මේ අනුව ඉහත යුගයන්හිදී මල්වතු ඔය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධය ලබා ගත හැකිය.

ප්‍රමුඛ පද : මල්වතු ඔය , අනුරාධපුරය , ආර්ථික, මාතොට

[1 2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.pavidu2017@gmail.com